අධ්‍යාපන සේවා ආයතන
Education Services Establishment

2 වන මහළ , ඉසුරුපාය/ 2 nd Floor ISURUPAYA
අධ්‍යාපන අමාත්‍යාංශය / Ministry of Education
දුරකථන /Telephone – 2784813
අභ්‍යන්තර දිගු / Ext – 1218


# MEMO

මගේ අංකය : ED/04/60/07/44 බඳවාගැනීම 2018/2019 (II) – 01 Vol 02
ඔබේ අංකය :
වෙතින් : අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
වෙත : අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව)
දිනය : 2025.01.08
විෂයය : ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සම්බන්ධව වන පොදු උපදෙස් ලිපි

---

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සම්බන්ධයෙන් මෑතකාලීනව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දී ඇති පොදු උපදෙස් සම්බන්ධ පහත ලිපි අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම සඳහා මේ සමඟ යොමුකරන බව දන්වා සිටිමි.

I. ED/04/60/07/44/ බඳවාගැනීම 2018/2019 (II) – 06 – SUB 02 අංක දරණ 2024.11.11 දිනැති ලිපිය (ඇමුණුම 01)
II. ED/04/60/07/44/ බඳවාගැනීම 2018/2019 (II) - 17 අංක දරණ 2024.12.10 දිනැති ලිපිය (ඇමුණුම 02)
III. ED/04/60/07/44/ බඳවාගැනීම 2018/2019 (II) – 01 VOL 02 අංක දරණ 2024.12.18 දිනැති ලිපිය (ඇමුණුම 03)

එම්.ජී. වාසනා සුරංගි එදිරිසූරිය
අතිරේක ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)

Scanned with CamScanner

අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය
கல்வி, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
Ministry of Education, Science and Technology
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref.: ED/04/60/07/44/බඳවාගැනීම 2018/2019(II) -06-SUB 02
ඔබේ යොමුව / உமது இல. / Your Ref.:
දිනය / திகதி / Date: 2024.11. 11

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් වෙත,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථානගතකිරීම් / ස්ථානමාරු කිරීම් පිළිබඳ අවනත නොවීම හා ජාතික පාසල් සඳහා තාවකාලික අනුයුක්ත ලබාදීම**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් පහත සඳහන් හේතුන් මත ස්ථාන මාරු සඳහා යටත් කරනු ලබයි.

I. වාර්ෂික ස්ථානමාරු නියෝග අනුව
II. සේවා අවශ්‍යතාවය මත ලබාදෙන ස්ථානමාරු නියෝග
III. විනය හේතු මත ලබාදෙන ස්ථානමාරු නියෝග
IV. නිලධරයාගේ ඉල්ලීම මත ලබාදෙන, ඉහත කරුණු 03ට ම අදාළ නොවන ස්ථානමාරු නියෝග

02. එසේම, ඉහත කරුණුවලට අමතරව නවක නිලධාරීන් ස්ථානගත කිරීමද සිදු කරනු ලබයි. ඒ යටතේ ඇතැම් නිලධාරීන් ජාතික පාසල් වෙත ස්ථානගත කරන අතර අනෙකුත් නිලධාරීන් පළාත් පාසල් වෙත ස්ථානගත කිරීම සඳහා පළාත් සභා වෙත තාවකාලිකව නිදහස් කිරීමද සිදු කරයි.

03. කෙසේ වුවද, මෙලෙස ස්ථානගත හෝ ස්ථානමාරු නියෝග ලබා දී ඇති ඇතැම් නිලධාරීන් එම නියෝග නොතකමින් මෙතෙක් සිය ගුරු සේවයේ නියුක්තව සිටි පාසලේ ම හෝ පෙර විදුහල්පති සේවයේ රාජකාරී ඉටුකරමින් සිටි පාසලේම තවදුරටත් සේවයේ රැඳී සිටිමින් විදුහල්පති සේවයේ වැටුප ලබාගන්නා බවට කරුණු වාර්තා වී තිබේ. මෙය කිසිසේත්ම අනුමත කළ නොහැකි තත්ත්වයක් වන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII පරිච්ඡේදයේ 31.1.14 වගන්තිය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකිරීමට සිදුවන බව කාරුණිකව දන්වමි.

04. එබැවින්, එසේ ස්ථානගත හෝ ස්ථානමාරු නියෝග නිකුත් කර ඇති මුත් මෙතෙක් ඊට අවනත නොවූ සියලු නිලධාරීන් මෙම ලිපියේ දින සිට දින 14ක කාලසීමාවක් තුළ අදාළ නියෝග පරිදි නියමිත සේවා ස්ථාන වෙත රාජකාරී සඳහා වාර්තා කිරීමට උපදෙස් ලබා දෙන ලෙසත් එම නියෝග සඳහා තවදුරටත් අවනත නොවන නිලධාරීන් සිටී නම් 2024 නොවැම්බර් මාසයේ සිට ඔවුන්ගේ වැටුප අත්හිටුවීමට කටයුතු කරන ලෙසත් ඔවුන්ගේ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ විදුහල්පති ශාඛාව වෙත දැනුම්දීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

05. තවද, මේ වන විට පළාත් සභා වෙත මුදා හැර ඇති මුත් පුරප්පාඩු නොමැතිවීම මත පළාත් සභා මඟින් ජාතික පාසල් තුළ තාවකාලික ස්ථානගත කිරීම් ලෙස රඳවා ඇති නිලධාරීන් ද කඩිනමින් සිය කාර්ය මණ්ඩලය යටතට ගෙන අදාළ පළාත තුළ ඇති පළාත් පාසලකට තාවකාලිකව අනුයුක්ත කර තබන ලෙසත් එසේ අනුයුක්ත කරනු ලබන නිලධාරීන්ගේ තොරතුරු සහිත නාමලේඛනයක් පළාත් අධ්‍යාපන ලේකම්ගේ අත්සනින් යුතුව අමාත්‍යාංශයේ විදුහල්පති ශාඛාව වෙත යොමුකරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

Scanned with CamScanner

06. එසේම, ස්ථානමාරුවීම් ලබා වෙනත් කලාප/පාසල් වෙත සේවය සඳහා වාර්තා කරන නිලධාරීන්ගේ පෞද්ගලික පිලිගොනු ඇතැම් පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් රඳවා තබාගන්නා බව මා වෙත වාර්තා වී ඇති බැවින් ස්ථානමාරු ලබා යන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 278 වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාල පාර්ශවයන් දැනුවත් කරන මෙන් ද කාරුණිකව දන්වමි.

07. ඉහත කරුණු පිලිබඳ ඔබගේ අවධානය යොමුකිරීම හා නිවැරදි අධීක්ෂණය මගින් විධිමත් පරිදි විදුහල්පති සේවාව ක්‍රියාත්මක කරවීම සඳහා ඔබ ලබාදෙන සහයෝගය පිලිබඳව කෘතඥ වෙමි.

ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්

Scanned with CamScanner

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/07/44/බඳවාගැනිම 2018/2019 (II) - 17

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.12. 10

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන්

**2023 වර්ෂයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවය III ශ්‍රේණියට බඳවා ගත් නිලධාරීන් කලින් දැරූ ගුරු සේවයේ තනතුරට පෙරළා යෑම.**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/02-05/04/2020 හා 2020.07.17 දිනැති ලිපියෙන් හා PSC/EST/02-03/07/2015 හා 2018.04.26 දිනැති ලිපියෙන් ලද උපදෙස් හා එම කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 02/2018 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් එක් අවුරුදු වැඩ බලන කාලය තුළ කලින් දැරූ තනතුර වන ගුරු සේවයට පෙරළා යාමට හැකියාව ඇත.

02. නිලධාරියාගේ ඉල්ලීම පරිදි පූර්ව තනතුරට පෙරලා යනු ලබන නිලධාරියකු , සේවා ගිවිසුමක් අනුව හෝ නිලධාරියාට ලබා දී ඇති පුහුණුවක් අනුව ගෙවිය යුතු මුදලක් ඇත්නම් එම මුදල අය කර ගැනිමෙන් පසු නිලධාරියාට පූර්ව තනතුරේ රාජකාරි භාර ගැනිම සඳහා නිදහස් කළ යුතු බැවින් නිලධාරියා විසින් සේවාරම්භක පුහුණුව ලබා ඇත්නම් ඒ සඳහා 2023 වර්ෂයේදී එක් නිලධරයකු වෙනුවෙන් වියදම් කර ඇති රු.**19,783.83**ක මුදල ආදායම් ශීර්ෂ **2003-02-99**ට බැර කළ යුතුය. සේවාරම්භක පුහුණුව සඳහා දින කිහිපයක් පමණක් සහභාගී වූ නිලධාරීන් ද එම සහභාගී වූ දින ප්‍රමාණයට අනුපාතිකව මෙම මුදල් බැර කිරීම සිදු කළ යුතු වේ.

03. එසේ නැවත ගුරුසේවයට පෙරළා යැවීමේ කටයුතු වලදී සලකා බැලෙන, **ඉල්ලීම සමඟ ඉදිරිපත් කළ යුතු ලිපිලේඛණ ඇමුණුම 01** මඟින් දක්වා ඇත. මෙතෙක් ලැබී ඇති ගුරු සේවයට පෙරලා යාමේ ඉල්ලීම් වල සාරාංශ ගත තොරතුරු **ඇමුණුම 02** හි දැක්වේ. එහි නම් සඳහන් නිලධාරීන්ගේ අඩුපාඩු ලිපි ලේඛණ සම්පූර්ණ කර සේවාරම්භක පුහුණුව සඳහා වැයවූ මුදල අයකරගන්නා ලද රිසිට්පතේ සහතික කරන ලද පිටපතක් ද සහිතව ඔබගේ **නිර්දේශ සමඟ** මා වෙත යොමුකිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. තවද සේවාරම්භක පුහුණුවට අමතරව වෙනත් යම් විශේෂ පුහුණුවක් හෝ වෙනත් හේතුවක් නිසා මෙම නිලධාරීන්ගෙන් රජය වෙත අය විය යුතු යම් මුදලක් වේද යන්න පිලිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කර එසේ වේ නම් ඒ පිලිබඳව මා දැනුවත් කිරීමට කටයුතු කළ යුතු වේ.

Scanned with CamScanner

04. තවද මෙසේ ඉල්ලීම් ඉදිරිපත් කළ හැක්කේ **එක් අවුරුදු වැඩ බලන කාලය තුළ** වන බැවින් 2023 වසරේ බඳවාගැනීමට අදාළව එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාව අවසන් වන **2024.11.15 දින දක්වා කලාප කාර්යාල වෙත ඉදිරිපත් වී ඇති ඉල්ලීම් පමණක්** ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් වැඩි දුරටත් කාරුණිකව දන්වමි.

ආචාර්ය කේ.පී. මුනගම
අතිරේක ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)

පිටපත් -

01. සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන් වෙත - ඉල්ලීම් සිදු කර ඇති නිලධාරීන් දැනුවත් කිරීමට, දැ.ගැ.ස හා අ.කා.ස

Scanned with CamScanner

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව කලින් දැරූ ගුරු සේවයට පෙරලා යාමේ ඉල්ලීම් සමඟ ඉදිරිපත් කලයුතු ඇමුණුම් සම්බන්ධ පිරික්සුම් ලේඛනය**

01. ආකෘති අංක 01
02. නිලධාරියාගේ ඉල්ලීම් ලිපිය
03. විදුහල්පති සේවයේ පත්වීම් ලිපිය (සහතික කරන ලද පිටපතක් ප්‍රමාණවත් වේ)
04. විදුහල්පති සේවයේ පත්වීම භාර නොගන්නා බවට සඳහන් කරන ලද අංක 05 පරිශිෂ්ඨය
05. සේවාරම්භක පුහුණුවේ පැමිණීමේ සහතිකය

**ස්ථානගතය අනුව වැඩ භාරගෙන ඇති නිලධාරියෙකු නම් පහත ලේඛනද ඉදිරිපත් කර තිබිය යුතුය.**

06. අංක 06 පරිශිෂ්ඨය-
07. ස්ථානගත කිරීමේ ලිපිය
08. වැඩ භාරගැනීමේ ලොග් සටහන්
09. විදුහල්පති සේවයට අදාළව නිලධාරියාට සේවාරම්භක පුහුණුව හැර වෙනත් යම් පුහුණුවක් හෝ ඒ ආශ්‍රිත කටයුත්තක් හේතුවෙන් රජය වෙත අය විය යුතු කිසියම් මුදලක් වේ ද / නොවේද යන්න හා එසේ වේ නම් ඒ කොපමණ ප්‍රමාණයක්ද යන්න පිළිබඳ තහවුරුවක්

සැ.යු -

- එක් අවුරුදු වැඩ බැලීමේ කාලය තුල ඉල්ලීම ඉදිරිපත් වී තිබිය යුතුය.
- සියළුම පිටපත් කළාප කාර්යාලයෙන් සහතික කර තිබිය යුතුය.

Scanned with CamScanner

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/04/60/07/44 බඳවාගැනීම<br>2018/2019(II) – 01 VOL 02 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.12. 18 |

සියළුම පළාත් අධ්‍යාපන ලේකම් වරුන් වෙත
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

**<u>ස්ථානගතය අනුව වැඩ භාර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.</u>**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ඇතැම් නිලධාරීන් සේවාරම්භක පුහුණුවෙන් පසු ස්ථානගත කිරීම් අනුව වැඩ භාර නොගැනීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් කරුණු වාර්තා වීම හේතුවෙන් මේ පිලිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් උපදෙස් විමසන ලද අතර එවැනි නිලධාරීන් සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව අංක PSC/EST/02-05/03/2020 හා 2024.09.04 දිනැති ලිපිය අනුව එම කොමිෂන් සභාවේ නියමය පරිදි පහත උපදෙස් ලැබී ඇත.

I. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් ලිපිය අනුව එම සේවයේ උපලේඛනගත තනතුරක සත්‍ය වශයෙන්ම සේවයට වාර්තා කරන ලද දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන් එම තනතුරේ ස්ථිර කිරීම.

II. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් ලිපියට අනුව එම තනතුරේ සේවයට වාර්තා කළ යුතුව තිබූ දින සිට සත්‍ය වශයෙන්ම එම තනතුරේ සේවයට වාර්තා කරන ලද දිනය දක්වා වන කාලය සඳහා ඔවුන් ගුරු සේවයේ කටයුතු කළා සේ සලකා ඊට අදාළව එවුන් වෙත වැටුප් ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා වැඩිපුර ගෙවීමක් සිදු කර ඇත්නම් අදාල වෙනස අය කර ගැනීම.

III. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් භාර ගැනීමෙන් පසුව ද එම නිලධාරීන් හට තම පූර්ව සේවා ස්ථානයේ ගුරු සේවයේ තනතුරෙහිම තවදුරටත් කටයුතු කිරීමට අවස්ථාව සලසා දුන් පාසල්වල විදුහල්පතිවරුන්ට විරුද්ධව සුදුසු පියවර ගැනීම.

02. ඒ අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් ලද නිලධාරීන් සම්බන්ධව වැටුප් ගෙවීමේ හා ස්ථිර කිරීමේ නිර්දේශ ඉදිරිපත් කිරීමේදී ඉහත උපදෙස් අදාළ කරගනිමින් කටයුතු කරන ලෙස හා මෙම උපදෙස් පිළිබඳව ඔබ පළාත යටතේ වන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

03. කෙසේ වුවද, මෙලෙස ස්ථානගත කිරීමේ නියෝග ලබාදී ඇති නිලධාරීන් එම නියෝග නොතකමින් කටයුතු කිරීම කිසිසේත්ම අනුමත කළ නොහැකි තත්වයක් වන අතර මෙවැනි අවස්ථාවන් හි දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVII පරිච්ඡේදයේ 31.1.14 වගන්තිය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීමට ද හැකියාව ඇති බැවින් ඉදිරියේදී මෙම තත්වයන් වලක්වාගැනීමට පොදුවේ සියළු පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආචාර්ය කේ.පී. මුනගම
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
ලේකම් වෙනුවට



Scanned with CamScanner